# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 19th July 2021

පැමිණිලි පාර්ශවය : ඒ.එච්.එෆ්. හනීෆා මිය.
අංක : 14, කුරුදෙල්ගහ වත්ත,
අටුළුගම,
බණ්ඩාරගම.

වගඋත්තර පාර්ශවය : ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
බණ්ඩාරගම.

**<u>පැමිණිලි අංකය : HRC/1120/19</u>**

පැමිණිල්ල :

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා උපතින්ම මුස්ලිම් ජාතික කාන්තාවක් බවත්, 2008 වසරේදී සම්පත් ගුණතිලක යන අය සමග විවාහ වීමෙන් පසුව මුස්ලිම් ආගම අතහැර බෞද්ධයෙක් බවට පත්වූ බවත්, එම නිසා මීට පෙරද තම ග්‍රාමයේ වැසියන්ගෙන් තමාට හිරිහැර වූ බවයි. එනම්, 2017 වර්ෂයේ රෝෂන් නවුෆර් යන අය තම නිවස ඉදිරිපිටට පැමිණ සරම උස්සා පෙන්වූ බවත්, ඒ සම්බන්ධයෙන් තමා විසින් බණ්ඩාරගම පොලිසියට පැමිණිලි කිරීමෙන් පසුව පොලිසිය කැඳවා එම පුද්ගලයාට අවවාද කොට මුදා හැරිය බවත්ය.

පසුව 2019.03.24 වන ඉරු දින රාත්‍රී 8.30 ට පමණ පැමිණිලිකාරියගේ මව වන වජී යන අයත්, අවුරුදු 11 වයසැති සේනාධි ශිම්මි ගුණතිලක සහ අවුරුදු 7 ක් වයසැති ෂෙහාරා අමානි ගුණතිලක යන දරුවන් දෙදෙනා සමග අටුළුගම බණ්ඩාරගම ලිපිනයේ සිටියදී තම නිවසට යාබද වැසිකිලියේ යම් පුද්ගලයෙක් රැඳිසිටි අතර, ඒ සම්බන්ධයෙන් සොයා බැලීමේදී ඔහු සී.අයි.ඩී එකේ නිලධාරියෙක් බවට පවසා සිටි බවත්, පසුව තම මවටද ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කර ගෙදර පිටුපස දොර වසා නිවස තුළ සිටියදී විශාල පිරිසක් පැමිණ ගේ වට කර දොරට තට්ටු කර තමන් පැමිණියේ පල්ලියෙන් බව දන්වා දොර අරින ලෙසට දැනුම්දුන් බවත් සඳහන් කර ඇත. නමුත්, දොර විවෘත නොකළ පසු ඔවුන් ජනේල් වලට පහර දෙමින් වහළයට නැග උළු



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. සභාපති / தவிசாளர் } 011-2505451 ෆැක්ස් / தொலைநகல் } 011-2505541 / 74 ඊමේල් / மின்னஞ்சல் } sechrc@gmail.com

ගලවමින් කලහකාරි ලෙස හැසිරුනු අතර, පැමිණිලිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් බණ්ඩාරගම පොලිසියේ 119 අංකයට අමතා තමාව බේරාගැනීම සඳහා පොලිසිය එවන ලෙසට දැනුම්දුන් බව සඳහන් කර ඇත. පැයකට පමණ පසුව පොලිසියෙන් පැමිණි බවත්, ඒ සමගම දොර කඩා පොලිසිය සමග එම පිරිස ද නිවස තුළට පැමිණි බවත්, පොලිසිය විසින් වැසිකිළියේ සිටි පුද්ගලයා අත්අඩංගුවට ගත් බවත්, ඒ අවස්ථාවේදී තමාත්, කුඩා දරුවන් දෙදෙනාත් කාමරයකට ගොස් දොර වසා ඒ තුළට වී සිටින විට පැමිණි පිරිස දොර කඩාගෙන කාමරයට පැමිණ තමන් පල්ලියෙන් පැමිණි බවත්, පල්ලියේ නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බවත් ප්‍රකාශ කළ බව ද, එසේම එම පිරිස පැමිණිලිකාරියගේ ඇඳුම් ඉරා දැමූ බවද, පොලිස් නිලධාරින් බලාගෙන සිටි බවත් සඳහන් කර ඇත. මෙම පිරිස අතර සිටි රෝෂන් සහ වසීම් යන අය තමාට ලිංගික හිරිහැර කළ බවද, තමාව පල්ලියට රැගෙන යා යුතු බවට පොලිසියටද කෑ ගැසූ බවද පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත. එසේම එම ස්ථානයට පැමිණ සිටි පොලිස් නිලධාරින් 4 දෙනා තමාට අපහාස වන අයුරින් කථා කර පොලිසියට යාමට එන ලෙසට දැනුම්දුන් බවත්, තමා වරදක් නොකළ නිසාත්, තමාගේ කුඩා දරුවන් සිටින බැවින් තමාට පොලිසියට යාමට නොහැකි බවට ඔවුන් වෙත ප්‍රකාශ කළද, එම නිලධාරින් පැමිණිලිකාරිය නිවසින් එළියට ගත් බවත්, ඒ අවස්ථාවේදී පැමිණ සිටි පිරිස පැමිණිලිකාරියට අඩම්තේට්ටම් කළ බවත් සඳහන් කර ඇත. මේ අවස්ථාවේදී කුඩා දරුවන් විලාප තියා කෑ ගැසූ බවත්, කිසිදු කාන්තා පොලිස් නිලධාරිනියක් නොසිටියදී පොලිසිය විසින් ත්‍රීවිල් රථයකින් පැමිණිලිකාරිය සහ දරුවන් දෙදෙනාව පොලිසිය වෙත රැගෙන ගිය බවත්, පසුව කාන්තා පොලිස් නිලධාරිනියක් තමාව පොලිස් කුඩුවට දැමීමට උත්සාහ කළ බවත් සඳහන් කර ඇත. මේ අවස්ථාවේදී ස්ථානාධිපතිවරයා පොලිස් ස්ථානයේ සිටි බවත්, පසුදින දරුවන්ගේ විභාග පවතින බැවින් ගෙදර යාමට අවශ්‍ය බවට ඔහු වෙත දන්වා සිටියද ඒ සඳහා ඉඩදිය නොහැකි බවත්, "ෂරියා නීතිය ගැන දන්නවා නේද" කියා පැමිණිලිකාරියට තර්ජණය කළ බවත් සඳහන් කර ඇත.

පසුදින තම ස්වාමි පුරුෂයා පැමිණි පසු දහවල් 2 ට පමණ තමා මුදාහැරිය බවත් පැමිණිලිකාරිය පැමිණිල්ලෙන් සඳහන් කරන අතර, ඊට අමතරව මෙම සිද්ධිය සම්බන්ධයෙන් පැමිණ සිටි පිරිස වීඩියෝ කළ බවත්, පොලිස් නිලධාරින් ද වීඩියෝ කළ බවත්, එම වීඩියෝ පට Whats App සහ Face Book වල ප්‍රචාරය කර ඇති බැවින් ඒ තුළින් තමාට සහ තම දරුවන්ට දැඩි මානසික කම්පනයක් සිදුවූ බවත් පැමිණිල්ලෙන් වැඩිදුරටත් සඳහන් කර ඇත.

මීට අමතරව මෙම සිදුවීම සම්බන්ධයෙන් 2019.03.25, 26, 29 සහ 30 යන දිනවල පොලිසියට පැමිණිලි කළද පොලිසිය කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවද සඳහන් කර ඇත. ඉන්පසුව 2019.03.29 වන දිනද මොහොමඩ් සාදීන් සහ මොහොමඩ් මනුල්ලා යන අය තම නිවසට පැමිණ තමාට පහරදුන් බවද, ඒ සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කළද, පොලිසිය කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවද පැමිණිල්ලෙන් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**පැමිණිල්ල තහවුරු කිරීම සඳහා ඉදිරිපත් වී ඇති සාක්ෂි :-**

පැමිණිලිකාරියගේ මව වන මොහොමඩ් බුහාරි සිත්ති වජිහා යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, අබ්දුන් අසන් ෆාතිමා හතීෆා යන අය තම දියණිය බවත්, ඇය සිංහල පුද්ගලයෙක් සමග විවාහ වූ බවත්, ඇයට දරුවන් දෙදෙනෙක් සිටින බවත්, අටුළුගම පිහිටි තම නිවසේ තමා සමග පදිංචිව සිටින බවත්ය. තම දියණිය සිංහල අයෙකු සමග විවාහවීම නිසා පල්ලියෙන් ඇත්වීම සම්බන්යෙන් පල්ලියේ භාරකරුව හමුවන ලෙසට කරන ලද දැනුම්දීම් නොසලකා හැරිය නිසාත්, පල්ලියේ විරෝධතා නොතකා දියණිය යතුරු පැදිය පැදවීම හේතුවෙනුත්, මුස්ලිම් පල්ලියේ භාරකාර මණ්ඩලයෙන් හා ප්‍රදේශයේ මුස්ලිම් අයගෙන් ඇයට හිරිහැර හා අකටයුතුකම් වලට මුහුණපෑමට සිදුවූ බව ප්‍රකාශ කර ඇත. 2019.03.24 වන දින රාත්‍රී 8.00 ට පමණ විශාල පිරිසක් තම නිවස වට කොට සිටින විට තම දියණිය 119 අංකයට ඇමතුමක් ලබාදුන් බවද පැයකට පමණ පසු පොලිසියෙන් පැමිණි බවද, 200 කට වැඩි පිරිසක් නිවසේ දොර කඩා ඇතුළු වූ බවත්, ඒ අවස්ථාවේදී පොලිස් නිලධාරින් ද නිවස තුළට පැමිණි බවත් සඳහන් කර ඇත. නිවසේ දොර කඩා ඇතුලට එනවිට තමා ඇතුළු පිරිස කාමරයකට ගොස් දොර වසා ගත් බවත්, එම කාමරයේ දොරද කඩා ඇතුළු වී තම දුව අමානුෂික ලෙස ලිංගික හිංසනයකට ලක් කළ බවත්, ඒ අවස්ථාවේදී පොලිස් නිලධාරින් බලා සිටි බවත්, කුඩා දරුවන් දෙදෙනා දැඩි මානසික කම්පනකට පත්වූ බවත් සඳහන් කරන අතර, පැමිණ සිටි පිරිස පල්ලියේ නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බවට තර්ජනය කළ බවත් සඳහන් කර ඇත.

**සම්පත් ගුණතිලක යන අයගේ දිවුරුම් ප්‍රකාශය :-**

තමා පැමිණිලිකාරිගේ ස්වාමි පුරුෂයා බවත්, 2019.03.25 වන දින අළුයම 2.30 ට පමණ තමා පොලිස් ස්ථානයට ගිය බවත්, එවිට බිරිඳත් දරුවන් දෙදෙනාත් පොලිසියේ බංකුවේ වාඩිවී සිටි බවත්, ස්තානාධිපතිවරයා පැමිණීමෙන් පසුව බිරිඳව රැගෙන යා හැකි බව එහි සිටි නිලධාරියෙක් ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. උදේ 8.30 ත් 9.00 ත් අතර ස්ථානාධිපතිවරයා පොලිස් ස්ථානයට පැමිණි බවත්, තමා ඔහු සමග කථා කළ බවත්, එහිදී පොලිස් කූඩුවේ සිටි පුද්ගලයා සහ තම බිරිඳ අතර සම්බන්ධයක් පවතින බවත්, දුරකථන විස්තර පරීක්ෂා කිරීමේදී එය තහවුරු වූ බවත් ඔහු විසින් ප්‍රකාශ කර සිටි බවද දක්වා ඇත. පසුව දහවල් 1.00 - 1.30 ට පමණ පොතක අත්සන් කර බිරිඳ හා දරුවන්ව භාරගත් බව සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

බණ්ඩාරගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2019.03.24 වන දින 119 යටතේ සිදුකරන ලද දැනුම්දීමක් අනුව බණ්ඩාරගම අටුළුගම ප්‍රදේශයේ කුරුදෙල්ගහවත්ත ප්‍රදේශයේ නිවසකට සැකකටයුතු පුද්ගලයෙක් ඇතුළු වී සිටින බවත්,

ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන ලෙසට කරන ලද දැනුම්දීම අනුව එදින රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිටි පො.සැ.12179 ප්‍රේමසිරි ඇතුළු නිලධාරීන් කණ්ඩායමට අදාළ ස්ථානයට ගොස් පරීක්ෂා කරන ලෙසට දැනුම්දුන් බවත්, ඒ අනුව ඔවුන් එම ස්ථානයට ගොස් පරීක්ෂා කිරීමේදී පුද්ගලයින් 300 ක් පමණ වූ පිරිසක් නිවස වට කරගෙන සිට ඇති අතර, සැක කටයුතු පුද්ගලයෙක් සිටින බවත්, ඔහුව පරීක්ෂා කරන ලෙසටත් ඉල්ලා ඇත. ඒ අවස්ථාවේදී එම නිලධාරීන් නිවසට ඇතුළු වනවාත් සමග රැඳී සිටි පිරිසද නිවසට ඇතුළුවී ඇති අතර, එම පිරිස කලහකාරී ලෙස හැසිරී ඇති බවත්, එම තත්ත්වය පාලනය කිරීමට නිලධාරීන්ට සෑහෙන වෙහෙසක් ගැනීමට සිදුවූ බවත් ප්‍රකාශ කර ඇත. පසුව නිවසේ සිටි පුද්ගලයා අත්අඩංගුවට ගෙන එම සිද්ධිය තමා වෙත දැනුම්දීමෙන් පසුව තමා එම ස්ථානයට ගිය බවත් එම ස්ථානයට ළගා වන විට එම පිරිස විසිරී ගොස් සිටි බවත් සඳහන් කර ඇත. සැක කටයුතු පුද්ගලයා අදාළ නිවසට පැමිණියේ කුමකටද යන්න අනාවරණය නොවූ බැවින් එම නිවසේ සිටි කාන්තාවන් සහ දරුවන් දෙදෙනා එම ස්ථානයේ සිටීම අනාරක්ෂිත බව පෙනීගිය නිසා එම අයගේ ආරක්ෂාව සඳහා පොලිස් ස්ථානයට රැගෙන ආ බවත්, සැක කටයුතු පුද්ගලයා ගැන සොයා බැලීමේදී මෙම පුද්ගලයා අතුරුගිරිය පොලිස් ස්ථානයේ සේවය කරන අනුරාධ ශ්‍රී බණ්ඩාර නැමති අය බවට හඳුනාගත් බවත්, සඳහන් කර ඇත.

එසේම මුස්ලිම් වැසියන් ගමට සැක කටයුතු පුද්ගලයන් පැමිණීම සම්බන්ධයෙන් දැඩි සැකයකින් කරුණු ඉදිරිපත් කළ බවත්, පැමිණිලිකාරිය විසින් සිදුකරන පැමිණිල්ලට අදාළව වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇති පුද්ගලයින් 05 දෙනෙක් කැඳවා පැමිණිලිකාරිය සහ ඇයගේ ස්වාමි පුරුෂයා කැඳවා 2019.04.02 වන දින පරීක්ෂණයක් කළ බවත්, ඒ අනුව ප්‍රදේශයේ නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා එනම් ගම්මානයේ මුස්ලිම්වරු 16,000 ක් පමණ ජීවත් වන බැවින් පැමිණිලිකාරිය සහ තවත් සිංහල පවුල් කිහිපයක් පමණක් එහි ජීවත් වන නිසා පැමිණිලිකාරියගේ හැසිරීම මත ජාතික වශයෙන් බලපෑම් එල්ල විය හැකි අපරාධමය තත්ත්වයක් ඇතිවිය හැකි බැවින් පැමිණිලිකාරියට එම ප්‍රදේශයේ ජීවත්වීමට සුදුසු පරිසරයක් ඇති කිරීම සඳහා පැමිණිලිකාරියගේ හා වගඋත්තරකරුවන්ගේ ඉල්ලීම මත පැමිණිල්ල සමථයට පත් කිරීමට කටයුතු කළ බවත් සඳහන් කර ඇත. පැමිණිලිකාරිය රු. 28,000/- ක මුදලක් වගඋත්තරකරුවන්ගෙන් ලබාගැනීමට එකගවීම මත සමථයට පත්වීම කළ බවද සඳහන් කර ඇත. නමුත් අදාළ සිදුවීම සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක් හා වීඩියෝ පට දෙකක් සමග පැමිණිලිකාරිය පැමිණිලි කර තිබූ බැවින් පැමිණිලිකාරියගෙන් නැවත පැමිණිල්ලක් සටහන් කර එම ප්‍රකාශයේ සඳහන් පුද්ගලයන් 20 දෙනා අතරින් 06 ක් අත්අඩංගුවට ගෙන 2019.06.21 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කළ බවද සඳහන් කර ඇත.

කොමිෂන් සභාව අසන ලද ප්‍රශ්ණ වලට පිළිතුරු වශයෙන් ස්ථානාධිපතිවරයා සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරියගේත් ඇයගේ දරුවන්ගේත් ආරක්ෂාව සඳහා ඔවුන් පොලිස්භාරයට ගත්

බවත්, පැමිණිලිකාරිය පොලිස් ස්ථානයට රැගෙන යාමේදී කාන්තා නිලධාරිනියක් භාරයේ රැගෙන යාමට ඒ අවස්ථාවේදී අවස්ථාවක් නොතිබූ බවත්, ඇය සමග ඇයගේ දරුවන් දෙදෙනා සිටි බවද ප්‍රකාශ කර ඇත. 2019.03.25 වන දින පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා පැමිණි පසු ඔහුට ඇය සහ දරුවන් භාරදුන් බවත්, මෙම අය රාත්‍රි කාලයේදී ආරක්ෂිත මාතාවක් යටතේ ස්ථානයේ සිටි බවත් දක්වා ඇත.

2019.09.05 වන දින නැවත කොමිෂන් සභාව වෙත පාර්ශවයන් කැඳවීමේදී පැමිණිලිකාරිය පොලිසියට කර තිබූ පැමිණිලි සම්බන්ධයෙන් වගඋත්තරකරුවන්ගෙන් වැඩිදුරටත් කරුණු විමසීමට ලක් කර ඇත. එහිදී වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, 2019.06.27 වන දින කරන ලද කරුණු දැක්වීමට අමතරව මෙම සිද්ධිය අනුව ගොනු කර ඇති ඉතිරි නඩු වල ඉතිරි වගඋත්තරකරුවන් අවස්ථා කිහිපයකදීම අත්අඩංගුවට ගැනීමට කටයුතු කළත් එම පුද්ගලයන් අටුළුගම ප්‍රදේශය හැරගොස් ඇති බවත්, එසේම දෙපාර්ශවය අතර සිදුකරගෙන ඇති බැණවැදීම් සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කර තිබූ බවත්ය. එම අධිකරණයේ නියෝගයක් අනුව ඉම්ටියාස් නමැති අයෙකු අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙසට නියෝග කර තිබූ බව සඳහන් කරන අතර, ඒ සම්බන්ධයෙන් තමා පොලිස් නීති කොට්ඨාශයෙන් හා අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන් රැකබලා ගැනීමේ අධිකාරියේ අධ්‍යක්ෂතුමියගෙන් ද, පානදුර මහාධිකරණයේ අධිනීතිඥතුමියගෙන් ද උපදෙස් පැතූ අතර, පනත අනුව වරදක් සිදුවී ඇති බවට ගැටළු සහගත බැවින් නීතිපතිතුමාගේ උපදෙස් පැතීමටත් අධිකරණයට වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කළ බව සඳහන් කර ඇත. ඒ අනුව ගරු අධිකරණය අදාළ පුද්ගලයා දින 14 ක් බන්ධනාගාර ගත කිරීමට නියෝග කළ බවත්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන මිරිහාන විශේෂ විමර්ශන ඒකකය මගින් සිදුකරන ලෙසට නියෝග කළ බවත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාරිය 119 යටතේ පැමිණිල්ලක් කරමින් විශාල පිරිසක් නිවස වට කර තර්ජණය කරන බවට පොලිසිය වෙත දැනුම්දීම් කර ඇති අතර, ඒ අනුව පොලිස් නිලධාරීන් පැමිණ ඇති බවත්, වගඋත්තරකරුවන් හා පැමිණිලිකාරිය ඉදිරිපත් කර ඇති වීඩියෝ දර්ශන අනුව විශාල පිරිසක් එක්රැස්වී කලහකාරි ලෙස හැසිරී ඇති බවටත් නිරීක්ෂණය වේ. මෙම අවස්ථාවේදී පැමිණිලිකාරිය ඇයගේ මවත්, කුඩා දරුවන් දෙදෙනාත් සමග නිවසේ සිටි බවද නිරීක්ෂණය වේ.

රැස්ව සිටි පිරිස පාලනය කිරීමට එම ස්ථානයට පැමිණි පොලිස් නිලධාරීන් අසමත් වී ඇති බව ද මෙහිදී නිරීක්ෂණය වේ. පැමිණිලිකාරිය හා දරුවන් පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඇති අතර, ඒ සඳහා කාන්තා පොලිස් නිලධාරිනියකගේ සේවය ලබාගෙන නොමැත.

එසේම පොලිස් භාරයේ සිටින විට පැමිණිලිකාරිය පාලිකාවක් යටතේ තබා ඇති බවට කරුණු ඉදිරිපත් වී ඇති අතර, පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා අළුයම පොලිස් ස්ථානයට ගොස් ඇති නමුත්, ඔහුට ඇයව භාරදී ඇත්තේ දහවල් 12.00 පසුව බවද නිරීක්ෂණය වේ.

තවද පැමිණිලිකාරිය තම ආගම වෙනස් කිරීම නිසා ප්‍රදේශයේ ප්‍රදේශවාසීන්ගෙන් ඇය වෙත බලපෑමක් තිබූ බවට නිරීක්ෂණය වන අතර, පැමිණිලිකාරිය විසින් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රදේශයේ බහුතර ජනයාගේ බලපෑම මත වගඋත්තරකරුවන් විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැති බවද එය පක්ෂග්‍රාහිව සිදුව ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරියගේ සහ දරුවන්ගේ ආරක්ෂාව සඳහා පොලිස් රැකවරණයට පැමිණිලිකාරියව රැගෙන ආ බවට කරුණු ඉදිරිපත් වුවද ඇයගේ ස්වාමි පුරුෂයා පොලිස් ස්ථානයට ඉදිරිපත් වූ අවස්ථාවේ පැමිණිලිකාරියව ඔහු වෙත භාරදීම සඳහා ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

පැමිණිලිකාරිය 119 අංකය යටතේ තම ජීවිතයට ඇති තර්ජණ සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට දැනුම්දී ඇති නමුත්, පොලිස් නිලධාරින් පැයකට පමණ පසුව පැමිණීම තුලින් සහ පොලිස් නිලධාරින් ඉදිරිපිට පැමිණිලිකාරියට හිරිහැර වීම වළක්වා ගැනීමට පොලිස් නිලධාරින් අපොහොසත්වීම තුලින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති නීතියේ රැකවරණය සර්ව සාධාරණවීමත්, කවර හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂත්වයකට භාජනය නොවීමේ අයිතියත් පැමිණිලිකාරිය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

එසේම, පැමිණිලිකාරිය විසින් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් සහ ඇයට ඇති බලපෑම් සම්බන්ධයෙන් පොලිසිය විසින් බහුතර බලපෑම් මත නිසි ක්‍රියාමාර්ග නොගැනීම තුලින් පුරවැසියෙකුට නීතියේ රැකවරණය ලැබීමේ සමාන අයිතිය නොලැබී යාම තුලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාවද උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

පවතින නීති තත්ත්වය අනුව යම් අයෙකුගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළුවක් පවතින විට එම අයගේ ආරක්ෂාව සඳහා පොලිස් භාරයට ගැනීමට හැකියාව ඇතත්, එම පුද්ගලයා කෙරෙහි එම තර්ජණය පහව ගිය පසුව හෝ එම පුද්ගලයාව පොලිස්භාරයෙන් මුදාහළ යුතුය. පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා 2019.03.24 වන දින අළුයම පොලිස් ස්ථානයට ගොස් ඇති අතර, උදේ 8.30 ත් 9.00 ත් අතර කාලයේදී ස්ථානාධිපතිවරයා ස්ථානයට පැමිණීමෙන්, පසුව ද, පැමිණිලිකාරියව සහ දරුවන්ව පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයාගේ භාරයට පත් කිරීමට

වගඋත්තරකරුවන් අසමත් වීම තුලින් පැමිණිලිකාරිය නීති විරෝධී රඳවා ගැනීමකට ලක්කිරීම තුලින් 13(2) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකමද උල්ලංඝනය වී ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

ඉෂාරා අංජලි එදිරිව වර්ණ බෝගහවත්ත නඩුවේදී "නීතිය බලාත්මක කරන නිලධාරින් මානව ගරුත්වයට ගරු කිරීම සහ ආරක්ෂා කිරීම, සියළුම පුද්ගලයන්ගේ මානව හිමිකම් පවත්වාගෙන යාම සහ ආරක්ෂා කිරීම, එම නිලධාරින්ගේ නිත්‍යානුකූලභාවය අවශ්‍යතාවය වෙනස් කොට නොසැලකීම, සමානුපාතිකව හා මනුෂ්‍යත්වය යන මූලධර්ම වලට ගරු කළ යුතු බව, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් සැමවිටම වෙනස් කොට සැලකීමකින් තොරව නීතියේ සමාන ආරක්ෂාව ආරක්ෂා කළ යුතු බව සහ ප්‍රවර්ධනය කළ යුතු අතර, නීතිය ඉදිරියේ සියළු පුද්ගලයන් සමාන වන අතර, වෙනස්කම් කිරීමකින් තොරව නීතියේ සමාන ආරක්ෂාව හිමිවිය යුතු බවද, කාන්තාවන්ට හිංසනය කිරීම වැළැක්වීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් දැඩි ක්‍රියාමාර්ග ගත යුතු අතර, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනවබෝධයෙන් කටයුතු කිරීම සහ පොලිසියෙන් සිදුවන අතපසුවීම් වලක්වා ගැනීමෙන් නැවත ඔවුන් වින්දිතයන් බවට පත්වීම වළකා ගත යුතු බවත්, අත්අඩංගුවට ගත් හෝ රඳවා සිටින කාන්තාවන් වෙනස් කම් වලට ලක් නොවිය යුතු අතර, සියළු ආකාරයේ ප්‍රචණ්ඩත්වයෙන් හෝ සූරාකෑමෙන් ආරක්ෂා විය යුතු බවට" නියමයන් නිකුත් කර ඇත.

නිර්දේශය :-

01. කිසිදු බලපෑමකින් හෝ වෙනස්කමකට ලක්වීමකින් තොරව පැමිණිලිකාරිය විසින් කරන ලද පැමිණිලි වලට සහ ඇයට ලිංගික හිරිහැර සහ අඩම්තේට්ටම් කළ විත්තිකරුවන්ට විරුද්ධව නිසි අයුරින් නීතිය ක්‍රියාත්මක කර වගඋත්තරකරුවන්ව නීතිය ඉදිරියට පමුණුවන ලෙසත්,

02. නීතිය බලාත්මක කරන නිලධාරින් වන බණ්ඩාරගම පොලිස් ස්ථානයේ අදාළ ස්ථානාධිපති සම්බන්ධයෙන් විනයානුකූලව පියවර ගන්නා ලෙසත් පොලිස් කොමිෂන් සභාව වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

03. තවද, සුළුතර අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු බවට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් දැනුවත් කරන ලෙසත්, ඉදිරියේදී ඉහත ආකාරයෙන් කටයුතු නොකරන ලෙසට සමස්ත පොලිස් බලකාය වෙත දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට පොලිස්පතිවරයා වෙත දැනුම් දෙනු ලැබේ.

2021.08.19 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M [illegible] siri
Human [illegible] Sri Lanka

පිටපත :- 01. ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,
කොළඹ 07.

02. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

B/